# නිර්මාණ Nirmana



## බුදුහිමි යළි වඩිනු කුමට ?

දිස්වෙයි අකටයුතු බැලුබැලු සියලු තැන
බුදු හිමියනේ යළි මෙරටට වඩිනු මැන
යන ඇරයුම නොයෙක් උදවිය පෙරට ගෙන
ලියු කවි දුටිමි ඉන් හදවත සසල විණ

පෙර වැඩ දෙසූ බණ නැත පිළිපදින් නේ
වදනින් මිසක මනසින් බොදු නොවන් නේ
දුන් දේ වැඩට නොමගෙන පුස් කවන් නේ
යළි මොනවා ලබන්නද අඩගහන් නේ ?

සිව්සත්දම් දෙසා ඇත බුදුහිමි පැද
ඇසුවා මිසක ඒවා පිළිපැද් දාද ?
යළි එන්නැයි කියන්නේ වැඳ වැඳ පාද
පස්වැනි ෂත්‍රයක් දෙසතැයි සිතු වාද?

යා යුතු මග කියා ඇත බුදුහිමි අපට
වැඳ වැඳ සිටිමු පඅ එහි යාමක් නොකොට
යළි වැඩියොත් තිලෝගුරු හිමි මගෙ රටට
කර ගහගෙන අරං යාවිද ? මොක් පුරට

වෙන පිහිටක් නොමැත තමුනට තමුන් මිස
යන්නයි බුදු පියාණන්ගේ උතුම් බස
නොම සිට දමන තුරු හිමි වැඩ අදම පිස
වෙර ගත යුතුය ගුරු කොට දෙසු සහම් රැස

පෙර වැඩි දා දෙසූ බණ ඇත තොග ගානේ
යොමුකළ මැනවි ඒ වෙත ඔබෙ අව දානේ
ඇයි මේ යැදුම් කඳුළැලි පිස පිස මූණේ
හිමි ළඟ නොවෙයි ඔබ ළඟමය නිරු වානේ

වැඳ වැටිවැටී දම් දෙසුමෙන් සවන තෙමයි
මොහොතින් සියල්ලම මනසින් ඉවත දමයි
හිමි වැඩ නිවන් දක්වන තුරු දෙනෙත යොමයි
තව සිය වරක් වැඩියත් ඔච්චරම තමයි

තව වාරයක් වඩිනා තුරු නොවී පමා
නුවණැස එහිමි පෙනුවූ මාවතේ යොමා
තැත් කළ මැන නිවෙන්නට දුක් නිවා දමා
එතකොට බුදුන් යළි වැඩියා වගේ තමා!

♦ **පූජ්‍ය දියකඩුවේ සරණසිරි හිමි**
ක්ෂෙත්‍රාරාමය කුඩලිගම
නැබොඩ Sri Lanka

## පුතු එනතෙක් බලා හිඳිති!



පුංචි පුංචි
ලේන් පැටව්
මිදුල පුරා
දුව ඇවිදිති
පුංචි පුතා
කොහේ ඇතැයි
හිස් වනමින් මා විමසති

එදා පුංචි පුතු අද දින
අග නගරයෙ මහ වියතෙකි
ලේන් පැටව් පසු දිව ගිය
සිහිති දෙපා සිහිකරවති

බිළිඳු පුතුගෙ කිරි සුවඳට
ඉව ඇල්ලූ ලේන පැටව්
කිරි දත් පෑ සිනා පොදට
ගීත ගැයූ කුරුලු පැටව්

උන් සේරම මා වටකර
තනි රකින්න ඇතත් පුතේ
නුඹ නැති මේ ගම්මානය
මල් නැති දිය විලක් වගේ

නුඹ එන දා මා බලන්න
විල්මත මල් පිපෙයි පුතේ
ලේන් කුරුලු කැල එදවස්
සතුටු ගීත ගයයි පුතේ

**ලාල් අබේගුණරත්න**
Sri Lanka

## අම්මා සහ දියවර

මායිම් වැට නැති පැල්පතවත් නැති
මායිම රැකගත් අපෙ අම්මා
පන්දම් එළියෙන් ගත සුදුමැලි වී
නියරේ සක්මන් කළ අම්මා

නිදිකුම්බා කටු පය සීරෙන සඳ
කුඹුරු ලියැදි කඳුලෙන් තෙමුණා
වෙල් ඉපනැල්ලෙන් කරල් අහුලගෙන
ගෙපැලේ දුක් ගිනි නිවූ අම්මා

මිහින්තලා මහ සෑයේ ගැටිලා
සුසුම් ගඟක් අහසට ගැලුවා
වැව්තැවුල්ලේ පාළු කටුරොදේ
උළලේණිය ඉකිබිඳ හැඬුවා

අළුත හැදූ වැව දියවර මහුලට
මී මල් පිපිලා සැරසෙනවා
අම්මා නැති මුත් ඒ මංගල්ලෙට
සුවඳ අරන් සියොතුන් වඩිනා

♦ **සිරිල් චන්ද්‍රසිරි**
අනුරාධපුරය Sri Lanka

## ගොවි තරුණියගේ ප්‍රේමය

සිත්තරාවිය නුඹ තමයි
ජීවිතේ ගැඹුරු දෙනිවල පිපෙනා
මල් එකතුකොට අඳින
මුතුන්මිත්තන් සරුසාර කළ මෙබිමේ
කරල් පීදුණු එකම එක වී පඳුර
නුඹේ දෝතට දුන්න දවසේ
ළපටි අංකුර බෝපතක් සේ
සැලි සැලී හිනැහුණු හදවත
කරගැට මගක සිරවුණ
නුඹට නොවටින ප්‍රේමය
දහදිය සුවඳ එක්කොට
කලල් මඩ දිය මත ම සැඟවිණ
ළපටි අංකුර පැළපතක් වී
බණ්ඩි ගොයමින් බිම වැසෙන විට
නුඹට කියනට තිබුණු රහසක්
තවම දළු ලා වැඩෙයි හද ගැබ

♦ **කුලසිරි වික්‍රමාරච්චි**
Sri Lanka

## සඳ සමුගත් දා

පිරුණු සඳ ඔබ
නුබ ගැබට හිමි
පිරුණු සඳ ඔබ
මට අහිමි වුණු

සරා සඳ නුබ කුසට හිමි වී
අමාවක මට හිමි වෙලා
දිලි දිලී තිබු තරු ද නිවිලා
පහන් පැල අඳුරට වෙලා

රුදුරු වග තපෝ වන වැද
කුමරි බඹසර වනසනා
මිහි මවුන් විළි වැද - වදයි යළි
යළි බිලිවන බව ම දැන දැනා

♦ **වසන්තා කුමාරි දසනායක**
මයිලවලාන කිරිඳිවැල
Sri Lanka

## වැහි කුරුලු සෑදය

හිරි හැර ලද
වැහි පොදෙන්
නිදිගැට ඇරගත්
කුරුල්ලෝ
අත්තෙන් අත්ත
හැරදා බිමටැවිත්
පියාපත් විදා
නටති

බලබලා හාත්පස
ගයති
කැඳවති තවත්
බටිති මලිති
නිත්තෙන් ගයන
ගීත නවතා

ගයති වැස්සට
නැවත නැවතත්
නැවත නැවතත්
ප්‍රශංසා
තුති ගී

♦ **එරංගා පෙරේරා**
Netherlands

## වෙලාව

නිදියන්නේ වෙලාවකට
නැගිටින්නේ වෙලාවකට
වැඩට යන්නෙ වෙලාවකට
ගෙදර එන්නෙ වෙලාවකට

කෑම කන්නෙ වෙලවෙකට
බීම ගන්නෙ වෙලාවකට
නාගන්නේ වෙලාවකට
හැම දෙයක්ම වෙලාවකට

මනුස්සයෙක් වෙලාවකට
යන්තරයක් වෙලාවකට
මට හිතෙනව වෙලවෙකට
මැරෙයිද මං වෙලාවකට

♦ **සුනිල් පෙරේරා**
Skegness
Lincs UK



## කුළුඳුල් පුතුට

සුදු අරලියා මල් පෙත්තක මෙලෙක් බව
සුදු සඳ එළියෙ සිසිලස දෙන සිනා මුව
දුටු සඳ වැටුණි මහ කතරට උදක බිඳ
මගෙ ලොව එළිය කළ හිරු නුඹ පුංචි පුත !

මිට මොලවාන මොළකැටි සුසිනිඳු දෑතේ
ටිකිරි සිනා රැලි නගනා පුංචි පුතේ
පියුමක් මහා ඔසුවක් නැතිවුනත් පුතේ
මගෙ ලොව කිරුළ හිමි කුමරුන් නුඹයි පුතේ

කප්පරක් වෙහෙස මේ දිවි කතර බිමේ
රත්තරන් පුතේ නුඹගෙනි සිසිල වුණේ
නිම් තෙරක් නැතිය පැතුමන් නුඹට පුතේ
සිත් තොසින් බලා ඉමි මතු නැගෙන දිනේ

හෙට හිරු නැගෙන නව ලොව වෙත යා ගන්න
මොළකැටි දෙපා දින දින සවිමත් වෙන්න
විදුසර ලොවට පැණසර මිනිසෙක් මිසක
ලොකු මිනිහෙක් නොවී හොඳ මිනිහෙක් වෙන්න !

♦ **කමනිකා මොහොට්ටිගේ**
Cardiff -Wales - UK

## from Salalihini Sandeshaya of Ven. Thotagamuve Sri Rahula Thera
## තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන්ගේ සැළලිහිණි සංදේශයෙන්

පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නොව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැලණිය පුර වරට

කොත් අග දිලිසෙන මැණික් දිස්නය දෙද්දී ඒවා සැරසූ වර්ණවත් ධජ අග බඳින ලද කිංකිණි සීනුහඬ විහිදුවන, ඉතා අලංකාර ලෙස ඉදිවුණු ගොඩනැගිලි වලින් යුත්, කිසිදාක පැරණි නොවන, එහෙත් දිනෙන් දින සුන්දරත්වයට පත්වන කැළණි පුරවරයට දයාබර සැළලිහිණිය ඔබ පිවිසෙන්න !

Pehesaraniya mini peminiya koth agata
Banda kikiniya dada gihiniya viman vata
Nova peraniya wana ramaniya vitin vita
Selalihiniya vadu kelaniya pura warata

O Selalihiniya, enter the illustrious city of Kelaniya which never grows old but every time gains in beauty and is full of palatial buildings adorned with numerous pennons with jingling bells and with pinnacles from whose gems emanate bright rays !

## ශ්‍රද්ධාව

දැඩි ලෙස
මුල් ඇදගත්
චණ්ඩ
මාරුතයකටවත්
සෙලවිය නොහැකි
මහ පර්වතයක් වන්
ශක්තිමත්
ශ්‍රද්ධාව
කවුළු පියන්පත්
ඇර දෙයි
ඔබ ජීවිතයේ
නිවන් මගට

**ලුම්බිනි විතාන**
Langley UK

## කුවේට් සිහිනය

මගෙ සිහිනය මට දකින්න
ඉඩ හරින්න !
අනේ මමා මට දෙන්නකො
තව වුට්ටක් නිදාගන්න
පුතු සිහිනෙන් දකිනා විට
ඔබ ආවේ දොර කඩන්න
හදන විටම මට සිදුවුණි
සිහින ලෝකයෙන් මිදෙන්න
තව වුට්ටක් සිටියා නම්
පුතුත් සමග මට දොඩන්න
හැකිවෙනවා එහෙම වුනොත්
මගෙ මේ දුක නිවාගන්න!

♦ **මින්නේරියේ රෝහිණී**
කුවේට් - Kuwait

## රහසින් පතමි මව වෙන්නට නැවත මම !

ගිලන් ඇඳේ තනි පාලුව මකන් නට
යොවුන් පුතුට හැකිදැයි සිතුනේ මවට
නොහැකිය වැටහුණා නැති කරමින් සතුට
තනිවෙමි මගේ දුක් සිතුවිලි තුරුළු කොට

සෙනෙහස බෙදන්නට හැක මට දූ පුතුට
මැසිවිලි අසන්නට හැක නුඹලගෙ සෙතට
තනිකර යන වගක් වැටහෙන් නැති ලෙසට
සිටියත් නුඹල මගෙ සිතුවිලි තිබේ මට

යහතින් සිටින්නට සම්පත් ඇත මෙමට
සෙනෙහෙන් ඇසුරු කරනට අය සිටිති වට
එනමුදු දැනෙන්නේ ඇයි මට විටින් විට
අඩුවක් දූ පුතුනි නුඹලා නොමැති විට

මසැසින් නොපෙනුනත් දූ පුතු සැම විටම
මනසින් දැකගනිමි නුඹලා නිරතුරුම
යහතින් සිටින බව දැනුනම පහස කිම?
රහසින් පතමි මව වෙන්නට නැවත මම

සෙනෙහස ගලයි උතුරා යන ගඟට සම
කෙලෙසද බිඳින්නේ මම මේ සෙනෙහෙ බැම
මවකට නොහැක බුදුවෙන්නට කියනු කිම
වැටහෙයි දැන් මනාවට පිළිගනිමි මම

♦ **ලක්ෂ්මි පෙරේරා**
Carshalton - Surrey - UK

## ආදර නංගී වෙතට !

යටගිය හැකියාව ඔබ එව් කවිය තුළින්
යළි ඉපදුණා සුවඳක් සේ පිපුණු මලින්
නිල්වන් අහස මෙන් තොරවූ වළා කුලින්
සැරසේ මසිත රසකවි මුතු පබළු වලින්

තිසරණ සරණ ලද බැතිමත් සිතින් මගේ
හැසුරුණු දිනක පිරි සොම්නස් දහර දිගේ
දිව මතුරක් විලස සිහිපත් කරන අගේ
ඒවැනි පද බැඳුම් එවපන් සොඳුරු නගේ

තද නින්දක වැටුණු කවි සිත පිබි දූවා
ඉන් ලද සුවය තෙලිතුඩකින් හැඩ වූවා
යව්වන වියට නෑකම් යළි ළං වූවා
මගෙ නංගියේ සහතික ඇත්තයි මේවා

නැංවෙන සොඳුරු සිතුවිලි පිරි සිතුම් පට
ගෙන්වා කරළියට ඔබ වෙත එවන් නට
ලංකාවිත්ති මා සුරතට ලබන් නට
සුන්දර සිහිනයකි යළි යළි දකින් නට!

♦ **ඩොලී විතාන පතිරණ**
Ilford Essex UK

## පැතුම් පද

දෙදාස් හයසිය වසක් පැවත ආ බුදු දහම
වනපොතින් පොතපතින් සිතුවමින් රැගෙන විත්
මැරි මැරී උපදිනා මනුසතුන් සනසන්න
පරපුරෙන් පරපුරට ගෙනගියා .......

ළපටි පොඩි අය සමග මේරූ මහ වියතුන්ද
බණදහම් දත් අයද කෙලෙස්මල පිරි අයද
සංවරව සිටින ලෙස තුන්දොරම සතපවා
දහම්කඳ බිඳෙන් බිඳ වදාළා

පවින් වැළකී සිටන් කෝටියක් සිල් අරන්
ත්‍රිපිටකය පීරමින් නැණ පහන් දල්වමින්
ලොව ජනිත ෂතුන් හට නිවන් මග පාදනා
බුදුපුතුන් බෙහෝ කල් දිනේවා.......!

♦ **ප්‍රදීපා වික්‍රමසිංහ**
London SW19

## මතක සටහන් !

අරුනළු කිරණ පිබිදෙන්නට පෙර අහසේ
තෙරුවන් පුදා වැඩ අරඹා සිත් එකසේ
දරුවන් සැමට සෙනෙහස පෑ එක විලසේ
දැඩිකළ අයුරු සිහිවෙයි අප පෙර දවසේ

කැව්වා රස අහර ගත සුව පතා ගෙන
දුන්නා සිප්සතර නිසි ලෙස දයා වෙන
විසු විදුහලෙන් නිති විදු නැණ ලබා ගෙන
නැගුණා ඉන් පසුව අප උඩු ගුවනෙ යන

ඉරණම අනුව මා ලද බිරිඳක් ඇති ව
දිවි ගෙවනවා කරමින් රැකි රක්සා ව
මෙම බිම පරිසරයෙ නැත හෙළ සිරියා ව
සැමදා අපට මුතු ඇටයකි ලංකා ව

පෙම්බර මැණියනි ඔබ දෙව් ලොවේ හිඳ
සුපුරුදු විලස මට ආසිරි පතන සඳ
ගරුතර පියතුමනි දහසක් දරා හද
ඔවදන් පිළිපදිමි ඔබගේ දෙපා වැඳ!

♦ **ඉන්දු පෙරේරා**
Italy ඉතාලිය